නැගෙනහිර පළාත් සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

නැගෙනහිර පළාත් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2025 අගෝස්තු 07 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූලි 28 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහා භාණ්ඩාගාරයට පියවන ලද රු.56,378,484 ක අග්‍රිමය, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා නොතිබුණු අතර එම අග්‍රිම ශේෂය පියවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.	අග්‍රිම ලැබීම් ශුද්ධ අගය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්වෙන අතර ව්‍යාපෘති අරමුදල හා අනෙකුත් ප්‍රධාන අරමුදල් සඳහා මේ ආකාරයට වාර්තා කිරීම සිදුවේ.	භාණ්ඩාගාරයෙන් ලැබීම් සහ ගෙවීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ නිසියාකාරව ඇතුළත් කළ යුතුය.

(ආ)	සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළ රැස්කරන ලද එකතු වටිනාකම රු. 4,630,586 ක්වූ වාණිජ ක්‍රියාකාරකම් වලින් ලද ආදායම් සහ අනෙකුත් ආදායම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා නොතිබුණි.	පළාත් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කිරීමෙන් පසු මෙම වසරේ සිට මෙම ආදායම දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.	ද්විගණන දෝශ ඇති නොවන පරිදි වාණිජ අත්තිකාරම් ගිණුමට අදාල වන රැස්කරන ලද ආදායම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දැක්විය යුතුය.
(ඇ)	පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විභාග ගාස්තු ලෙස අයකරගෙන තිබූ රු. 5,306,550ක්වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ රු. 6,112,100 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ එම වටිනාකමේ රු. 805,550ක නොසැසඳූ වෙනසක් තිබුණි.	පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුදැනුමකින් තොරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සමහර ආදායම් සෘජුවම පළාත් භාණ්ඩාගාරයට යවා තිබීම නිසා වෙනසක් ඇත.	වෙනස් වීමට හේතු හඳුනාගෙන නිවැරදි කළ යුතුයි.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ ව්‍යවස්ථාපිත අධිකාරීන් 02 ක රු. 5,187,792ක්වූ සමුච්චිත ඌණතාවයන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල සමුච්චිත හිමිකම එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	ව්‍යවස්ථාපිත ආයතනවල ඌණතාවය ඒ සඳහා අග්‍රිම නිකුත් කරන ආමාත්‍යාංශවල මූල්‍ය ප්‍රකාශනවල පෙන්වනු ලැබේ.	පළාත් සභා මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය කාර්යසාධන වාර්තාවේ ව්‍යවස්ථාපිත අධිකාරීවල ඌනතා හා අතිරික්තතා ගැලපීම සිදුකළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂයේ ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදල් ගිණුමේ රු. 9,315,118ක් වූ හිමිකම් වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පළාත් සභාවේ මුළු හිමිකම් අගය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.	ආණ්ඩුකාරවරුන්ගේ භාරකාර අරමුදල පළාත් අරමුදලක් නොවන නමුත් එය ව්‍යවස්ථාපිත භාරකාර අරමුදලක් වන බැවින් එම අරමුදලේ වත්කම් හෝ වගකීම්වල වටිනාකම පළාත් සභා අරමුදල් ගිණුමට ඇතුළත් කළ නොහැක.	පළාත් සභා අරමුදලේ මුදල් උපයෝගී කර ආරම්භ කර පවත්වා ගෙන යන ආණ්ඩුකාර අරමුදල පිහිටුවා ඇති බැවින් එම අරමුදල පළාත් සභාවේ මුළු හිමිකමට ගැලපිය යුතුය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව, සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ වංචා හා වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නැගෙනහිර පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල යෝග්‍යතාවය අගයන ලදී
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.5.1 ශීර්ෂය - 900 ගරු ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.6 වගන්තියට පටහැනිව කාර්ය මණ්ඩල නිවාස සඳහා තක්සේරු කුලිය අයකර ගැනීම වෙනුවට ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත මසකට රු.1,000 ක් බැගින් නාමික කුලියක් අයකර ගැනීමට කටයුතු කිරීම නිසා මසකට අයකර ගත යුතු රු.1,922,400 ක කුලී ආදායම වෙනුවට රු.360,000 ක ඉතාම අඩු කුලියක් පමණක් අයකර ගෙන තිබුණි.	ප්‍රධාන ලේකම්වරයාගේ ඉල්ලීම් ලිපිය අනුව ආණ්ඩුකාරවරයා අනුමැතිය ලබාදී ඇත. 2018-2020 හා 2021-2023 කාලයට අදාලව තක්සේරුව ලබාගෙන ඇත. 2019 වර්ෂයේ අනුමැතිය මත රු.1,000 අයකර ඇත. 2024-2026 කාලයට අදාල තක්සේරු වාර්තාව අනුව 2025 ජූලි මස සිට නව ආර්ථික අනුපාතවලට අනුව අයකර ඇත.	ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.

1.5.2 ශීර්ෂය - 901 පළාත් රාජ්‍ය සේවා කොමිසන් සභාව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2019 ඔක්තෝබර් 10 දිනැති අංක 03/2019 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛයට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළදී ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් 04 දෙනෙකු සහ ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I පන්තියේ නිලධාරියෙකු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය සහිතව නැවත සේවයේ යොදවා විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙස පත් කර පුද්ගල පඩිනඩි සහ අනෙකුත් මූල්‍ය නොවන ප්‍රතිලාභ ලෙස රු. 1,923,401 ක් ගෙවා තිබුණි.	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් නැවත සේවයේ පිහිටුවීම නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් නිර්දේශ කර ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබාදී ඇත. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඒ සඳහා මැදිහත් නොවේ.	අදාල චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

(ආ)	සමාලෝචිත වර්ෂය තුළ කාර්යක්ෂමතා කඩඉම් විභාග 107 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද ඉන් සියයට 94 ක් එනම්, විභාග 101 ක් පවත්වා නොතිබුණි. එකී විභාග පැවැත්වීමට අයදුම්පත් කැඳවීමට පෙර එක් එක් විභාග පවත්වනු ලබන දින වකවානු පිළිබඳව සහ නිලධාරීන්ගේ විස්තර නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) වෙතින් පූර්ව විමසීම් සාකච්ඡා කිරීම් සිදු කර විභාග දින වකවානු තීරණය කිරීමට කටයුතු කර නොතිබීම මත බොහෝ විභාග පැවැතිවීමට නොහැකි වී තිබුණි.	වසර තුළ බඳවා ගැනීමේ විභාග සහ සම්මුඛ පරීක්ෂණ කිහිපයක් පැවැත්වීම හේතුවෙන් කාර්යක්ෂමතා කඩඉම් විභාග කෙරෙහි අවධානය අඩුවිය. වර්තමානයේ කොමිෂන් සභාවේ උපදෙස් අනුව කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වනු ලැබේ.	කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම නිසි සැලසුමකට අනුව සිදු කළ යුතුය.

1.5.3 ශීර්ෂය - 921 නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය - මූල්‍ය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය සඳහා එකතු කරන ලද මුළු ආදායමෙන් සියයට 73 ක් වූ රු. 3,080,590,555 ක විවිධ ආදායම් වර්ග CIGAS භාවිතයෙන් ගිණුම්ගත කිරීම වෙනුවට අතින් (Manual) ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සැබෑ ආදායම් එකතුව විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය. එම තත්ත්වය එසේම තිබියදී, වසර 10 ක් පුරා CIGAS භාවිතයෙන් ආදායම් කළමනාකරණය කිරීමට පියවර ගෙන නොතිබුණි.	මෙම වසරේ සිට CIGAS හරහා සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.	CIGAS භාවිතයෙන් ආදායම් කළමනාකරණය සිදු කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	2010 සිට 2024 දක්වා කාලය තුළ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් එකතු කරන ලද මුද්දර ගාස්තු වටිනාකම රු. 6,475,265,224 ක් වුවද, රු. 3,988,410,844 ක මුදලක් පමණක් පළාත් පාලන ආයතන වෙත ප්‍රේෂණය කර තිබුණි. ඒ අනුව, රු.1,435,808,941 ක මුද්දර බදු ආදායමක් වසර 01 සිට 14 දක්වා කාලය තුළ පළාත් පාලන ආයතන වෙත ප්‍රේෂණය නොකර පළාත් සභා අරමුදල් ගිණුමට බැර කර තිබුණු අතර තවත් රු. 1,051,045,439 ක මුදලක් ආදායම් ගිණුමේ රඳවාගෙන තිබුණි.	අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලද ප්‍රමාද ඉල්ලීම් පිළිබඳ අමාත්‍යවරයා සෑහීමකට පත්වන්නේ නම් එම අරමුදල් නිදහස් කිරීමට අධිකාරියට නියෝග කළ හැකිය.	එකතු කරන ලද මුද්දර ගාස්තු අදාල පළාත් පාලන අයතනවලට නිසි කාලයේදී ප්‍රේෂණය කිරීම සිදු කළ යුතුය.

(ඇ)	විවිධ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වල පුනරාවර්තන සහ ප්‍රාග්ධන ක්‍රියාකාරකම් සඳහා රු.1,858,907,000 ක පරිපූරක ප්‍රතිපාදන ඉල්ලා තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරයෙන් රු. 3,854,041,834 ක පරිපූරක ප්‍රතිපාදන ලැබී තිබූ අතර, එසේ ලද මුළු පරිපූරක ප්‍රතිපාදනවලින් සියයට 68 ක් හෙවත් රු. 2,612,070,826 ක මුදලක් උපයෝජන කිරීමෙන් තොරව පැවතුණි. එසේම, සමාලෝචිත වර්ෂය අවසානයේ මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකර රු. 1,139,468,561 ක මුදලක් පළාත් සභාවේ විවිධ බැංකු ගිණුම්වල රඳවා තිබුණි.	රුපියල් මිලියන 2612 ක ශේෂය නිසි ලෙස භාණ්ඩාගාරයට යවන ලදි.	මුදල් රෙගුලාසි 50 අනුව නිසි සැලසුමකින් අයවැය සකස් කිරීම සිදු කළ යුතුය.
(ඇ)	2008 අංක 01 දරන නැගෙනහිර පළාත් මූල්‍ය ප්‍රඥප්තියේ 102A (01) වගන්තිය ප්‍රකාරව ආදායම් දිරි දීමනා අරමුදල ස්ථාපිත නොකර, 2018 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ නැගෙනහිර පළාත් සභා අරමුදල් ගිණුමෙන් අරමුදල් ලබා ගෙන විවිධ තනතුරු කාණ්ඩ 14 කට අදාල විවිධ නිලධාරීන් 98 දෙනෙකුට රුපියල් 63,883,271 ක දිරි දීමනාවක් ප්‍රධාන ලේකම්වරයා විසින් අනුමත කර ගෙවා තිබුණි. එසේම දිරි දීමනා ගෙවන විටෙක එම කාර්ය සඳහා වෙනත් දීමනා ගෙවීම් කළ නොහැකි වුවද එම තත්ත්වය සැලකිල්ලට නොගෙන වසර 06ක කාලය තුළ ආදායම් ඒකකයේ නිලධාරීන්ට අතිකාල හා නිවාඩු දින වැටුප් ලෙස රු.4,278,050ක් ගෙවීම් කර තිබුණි.	දිරිදීමනා අරමුදල පිහිටුවීම සඳහා නැගෙනහිර පළාත් ආණ්ඩුකාරතුමාගෙන් අනුමැතිය ඉල්ලා සිටින අතර අනුමැතිය ලැබුණු පසු අරමුදල ස්ථාපිත කරන්නෙමු. කාර්ය මණ්ඩල පුරප්පාඩු 17 ක් පවතින බැවින් පළාත් පාලන ආයතනවලින් වසරකට ලැබෙන ආපසු ගෙවීම් ඉල්ලීම් ලිපිගොනු 200 කට වඩා ඇති නිසා ඒවා ඉක්මණින් සිදු කිරීමට අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම සිදු කරයි.	2008 අංක 01 දරන නැගෙනහිර පළාත් මූල්‍ය ප්‍රඥප්තියේ 102A (01) වගන්තිය අනුව කටයුතු කළ යුතුය.

(ඉ)	වාණිජ කටයුතු 06ක් සම්බන්ධයෙන්, දෙපාර්තමේන්තු 02කට ලබා දුන් රු. 33,347,318ක වාණිජ අත්තිකාරම් වසර 10කට වැඩි කාලයක සිට හිඟව පැවති අතර, ඉන් රු. 20,836,536ක හිඟ ශේෂයක් පැවති වාණිජ අත්තිකාරම් ක්‍රියාකාරකම් 03ක් 2020 වර්ෂයේ දී වසා දමා තිබුණි.	ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුවට අදාළව පත්කරන ලද විශේෂ කමිටුවේ වාර්තාව පළාත් භාණ්ඩාගාරයට යවා ඇත. නිර්දේශය ලද පසු 2025 දී විසඳීමට කටයුතු කරයි. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් මෙහෙයුම් ගිණුම්වල සියළුම ශේෂයන් සෑම වසරකම අවසානයේ භාණ්ඩාගාරයට මාරු කරනු ලැබේ.	හිඟ අත්තිකාරම් ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඊ)	වාණිජ ගොවිපල 05 ක් අඛණ්ඩ පාඩු සහිතව ක්‍රියාත්මක වීමට ඉඩ හැර තිබූ අතර, එමඟින් සමාලෝචිත වර්ෂය සඳහා රු. 20,022,339 ක පාඩුවක් සිදුවී තිබුණි. එම ගොවිපලයන් වසර 05 කට වඩා වැඩි කාලයක සිට ලාභදායී ආකාරයකින් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය හරහා අනාගතයේදී මෙම ගොවිපළවල් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් ආරම්භ කිරීමට යෝජිතයි.	ගොවිපළ කටයුතු ලාභදායී ආකාරයට මෙහෙයවීමට කටයුතු කළ යුතුය.
(උ)	වෙනත් පළාත් සභා/ මධ්‍යම රජයේ දෙපාර්තමේන්තු වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් මාස 03 සිට අවුරුදු 20 දක්වා වූ කාලපරිච්ඡේදයක් තුළ අයවිය යුතු සේවක ණය ශේෂය රු.21,845,015 ක් විය.	අදහස් දක්වා නොතිබුණි.	අයවිය යුතු ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඌ)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන එකතුව රු. 19,313,790,133ක මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම සමඟ සැසඳීමේදී ආයතන 34හි මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ එකතුව රු. 12,851,428,259ක් ලෙසද, වත්කම් කළමනාකරණ පද්ධතිය අනුව රු.10,169,545,518ක් ලෙසද පෙන්නුම් කිරීම හේතුවෙන් එම වත්කම්වල වටිනාකම පිළිවෙලින් රු.6,462,361,874ක සහ රු. 9,144,244,615ක වෙනසක් පැවතුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	මූල්‍ය නොවන වත්කම්වලට අදාල එකිනෙක වාර්තා මඟින් ඉදිරිපත් කරන වටිනාකම් සසඳා නිවැරදි කළ යුතුය.

1.5.4 ශීර්ෂය - 912 - ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2022 දෙසැම්බර් 24 දින කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයෙන් ලැබුණු රු.3,107,750 ක මුදල ග්‍රාමීය කාර්මික භාණ්ඩ නිෂ්පාදනය වැඩිදියුණු කිරීමේ අරමුණ සඳහා භාවිතයට නොගෙන වසර 02 කට වැඩි කාලයක සිට ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුවේ පොදු තැන්පතු ගිණුම්වල රඳවා ගෙන තිබුණි.	පළාත් භාණ්ඩාගාරයේ මඟපෙන්වීම මත මුදල් රෙගුලාසි 571 අනුව පියවර ගෙන ඇත.	ලැබෙන අරමුදල් නිසි අරමුණු වෙනුවෙන් භාවිතා කළ යුතුය. භාවිතා නොකරන ලද අරමුදල් අදාල රාජ්‍ය අමාත්‍යාංශය වෙත යැවීම සිදු කළ යුතුය.
(ආ)	2014 වර්ෂයේදී රුපියල් 8,500,000 ක මුළු වියදමින් ඉදිකරන ලද මඩකලපුව ග්‍රාමීය කාර්මික අයිතම අලෙවි මධ්‍යස්ථානය 2023 මැයි 04 වන දින සිට වසා දමා තිබුණි. කෙසේ වුවද, ඉකුත් වසර 10 ක කාලය තුළ මෙම මධ්‍යස්ථානය පිහිට වීමේ අපේක්ෂිත අරමුණ ළඟාකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.	මාස 02 ක කාලයක් තුළ නැවත විවෘත කිරීමට සැලසුම් කරමු.	ආරම්භ කරන ලද ව්‍යාපෘති අපේක්ෂිත අරමුණු වෙනුවෙන් අඛණ්ඩව පවත්වා ගත යුතුය.

1.5.5 ශීර්ෂය - 920 ප්‍රධාන ලේකම් කාර්යාලය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ක්‍රියා පටිපාටි රීතිහි 32 ඡේදයට පටහැනිව 2019 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ නැගෙනහිර පළාත් සභාවේ අනුමත සේවක සංඛ්‍යාවට ඇතුළත්ව නොමැති නැගෙනහිර පළාත් නිවාස අධිකාරියේ සේවා කාණ්ඩ 07 ක සහ නැගෙනහිර පළාත් සංචාරක කාර්යාංශයේ සේවා කාණ්ඩ 05 ක කාර්ය මණ්ඩලයට එකතුව ජරු.5,595,000 ක වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ ගෙවා තිබුණි.	සංචාරක කාර්යාංශය මේ වන විටත් අනුමැතිය ලබාගෙන නැත. නිවාස අධිකාරිය කොන්ත්‍රාත් පදනම මත පත්වීම් සඳහා ගරු ආණ්ඩුකාරවරයා අනුමැතිය ලබා දී ඇත.	අදාල රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ක්‍රියාපටිපාටි රීතිහි 32 ඡේදය අනුව කටයුතු කළ යුතුය.

(ආ) 2019 ජනවාරි 1 සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ පළාත් සභාවේ ව්‍යවස්ථාපිත අධිකාරී 2ක විවිධ කාර්ය මණ්ඩල කාණ්ඩ 08 ක් සඳහා වසර 05ක සිට එම කාර්ය මණ්ඩලය අනුමත කර නොගෙන නැගෙනහිර පළාත් සභා අරමුදලින් එකතුව රු. 20,546,892 ක් වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ ලෙස ගෙවා තිබුණි.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සේවක සංඛ්‍යාව අනුමත කරන තෙක් නිලධාරීන් සඳහා කොන්ත්‍රාත් පදනම මත පත්වීම් සඳහා ගරු ආණ්ඩුකාරතුමා අනුමැතිය ලබා දී ඇත.	කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීම නිසි පරිදි සිදු කළ යුතුය.

1.5.6 ශීර්ෂය - 922 නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය - සැලසුම්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
නැගෙනහිර පළාතේ විශේෂ සංවර්ධන ව්‍යාපෘති **3**ක් සඳහා රු.318,000,000 ක මුදලක් අනුමත කර තිබූ අතර එකී ව්‍යාපෘති යටතේ ක්‍රියාකාරකම් 40ක් 2024 ජුලි 09 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විට ක්‍රියාකාරකම් 16 ක් මූලික මට්ටමේද තවත් ක්‍රියාකාරකම් 24ක් නොනිමි වැඩ තත්ත්වයේද විය. මේ අනුව, අනුමත ප්‍රතිපාදනයෙන් සියයට 91 ක් හෙවත් රු. 288,820,000ක් වූ ඇස්තමේන්තු ක්‍රියාකාරකම් 2025 මාර්තු 28 වන දින දක්වාම අවසන් කර නොතිබුණි.	මෙම ව්‍යාපෘතිය වසර 03 ක් සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිතය. මූලික කටයුතු සඳහා යම් කාලයක් ගතවී ඇත. පසුව මෝසම් වැසි ඇති විය. අයහපත් කාලගුණික තත්ත්වයන් සහ අදාල පාර්ශවකරුවන්ගේ අනුමැතිය ලබා ගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් සමස්ත ප්‍රගතිය පසුගාමී විය.	වසර තුළ ඉටු කර ගත හැකි ව්‍යාපෘති සංඛ්‍යාවක් පමණක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුය.

1.5.7 ශීර්ෂය - 923 නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය - පරිපාලන

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
පළාත් සභාව සඳහා වාහන 656ක් පැවතියද, 2020 ඔක්තෝබර් 26 දිනැති අංක 02/2020 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ අංක 01 ඡේදයට අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ඇතිව රියදුරන් බඳවා ගැනීමකින් තොරව අනුමත සේවක සංඛ්‍යාවෙන් 144ක් හෙවත් සියයට 31ක් පුරප්පාඩු වී පැවතුණි.	රියදුරු තනතුරු සඳහා උනන්දු වන වත්මන් කාර්යාල සේවකයින් අතර සම්මුඛ පරීක්ෂණයක් පැවැත් වූ අතර රියදුරු සේවක සංඛ්‍යාව බඳවා ගැනීමට කටයුතු කරන්නෙමු.	වාහන නිසි අයුරින් උපයෝජනය කිරීම සඳහා රියදුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය.

1.5.8 ශීර්ෂය - 924 නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය - ඉංජිනේරු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2022 සැප්තැම්බර් 16 දිනැති අංක 11/2022 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයට පටහැනිව වාහනවල හිමිකාරිත්වය අවලංගු නොකර 2022 මාර්තු 29 වන දින අබලන් වාහන 44ක් විකුණා තිබූ අතර, පසුගිය වසර 02 ක කාලය තුළ ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි.	ලියාපදිංචිය අවලංගු කරන ලෙස මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත දන්වා තිබුණද මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු නියෝජ්‍ය කොමසාරිස්වරයා විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	අදාල චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.
(ආ)	2022 ජනවාරි 25 දිනැති අංක 04/2022 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයට පටහැනිව ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගෙන, විවිධ දෙපාර්තමේන්තු කාර්යාලවල අපහරණය කළ යුතු වාහන 129ක් සහ භාවිතයට නුසුදුසු වාහන 217ක් තිබුණි.	අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා/ අමාත්‍යාංශ ලේකම්වරු විසින් රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව වෙන්දේසි ක්‍රියාපටිපාටියට යටත් ද සම්පූර්ණ කළ පසු වෙන්දේසි කිරීමට පියවර ගනු ලැබේ.	අදාල චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.
(ඇ)	ඇස්තමේන්තුගත පිරිවැය රු.36,450,000 වූ සංස්කෘතික ශාලාවක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2021 දී කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඒ වෙනුවෙන් රු.27,610,000 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, වසර 02 ක් ගතවී තිබුණද කර්මාන්තයේ වැඩ නිම කර නොතිබුණි.	කොන්ත්‍රාත්කරු මිය ගොස් ඇති හෙයින් මෙම වසරේදී කාර්යය නැවත ප්‍රදානය කර ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා කාර්යයන් සිදු කිරීමට නියමිතය.	අපේක්ෂිත කාල රාමුව තුළම ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන චක්‍රලේඛයේ 2 වගන්තිය සහ 2018 ඔක්තෝබර් 10 දිනැති අංක 03/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛවලට පටහැනිව පළාත් සභාවට අයත් නොවන සහ විවිධ ආයතන විසින් භාවිතා කරන ලද සාමාන්‍ය සහ විශේෂ කාර්ය වාහන 26ක් සමාලෝචිත වර්ෂය තුළ හිමිකාරිත්වය ලබාගැනීමකින් හා අයිතිය පවරා ගැනීමකින් තොරව වෙන්දේසි කර තිබුණි.	ඊළඟ වාහන වෙන්දේසියේදී පළාත් සභාවට අයත් නොවන වාහන සඳහා හිමිකාරිත්වය පවරා ගැනීම සිදු කෙරේ.	අදාල චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

1.5.9 ශීර්ෂය - 931 කෘෂිකර්ම අමාත්‍යාංශය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 ජනවාරි 16 වන දින වාරිමාර්ග අමාත්‍යාංශය මඟින් සූර්ය බලශක්ති වාරිමාර්ග පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා ලැබුණු රු. 19,250,000 ක මුදලක්, සමාලෝචිත වර්ෂය තුළ වැඩ ආරම්භ නොකර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.	ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි අවසන් වූ පසු එම මුදල තැන්පතු ගිණුමෙන් පියවීමට කටයුතු කරමි.	ව්‍යාපෘති වෙනුවෙන් ලද අරමුදල් ඒ වෙනුවෙන් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය.

1.5.10 ශීර්ෂය - 932 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 දී උප්පුවේලි සත්ව නිෂ්පාදන ගොවිපළ සඳහා රු.6,760,000 ක වියදමින් කිලෝ වෝල්ට් 40ක සූර්ය පැනල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණු අතර එමඟින් වාර්ෂිකව ගොවිපල සඳහා විදුලි ඒකක 30,000ක් නිෂ්පාදනය කිරීම අරමුණ වුවද එකී පද්ධතිය නිසි නඩත්තුවක් නොමැතිකම හේතුවෙන් පද්ධතියට විදුලිය ජනනය සිදු නොවීම මත 2023 අගෝස්තු මාසයේ සිට අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකිවී තිබුණි.	අදාල සමාගම පිළිබඳ තොරතුරු සොයා ගත නොහැකි වී තිබුණි. සමාගමට අදාල පෞද්ගලික ලිපිනයක් ලැබී තිබූ අතර ඒ හරහා සමාගම සම්බන්ධ කර ගැනීමට පියවර ගනිමින් සිටී.	ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳව නිරන්තරව පසු විපරම් කටයුතු සිදු කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත යුතුය.

1.5.11 ශීර්ෂය - 933 - සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 සිට 2024 දක්වා කාලය තුළ ආහාර කොමසාරිස්වරයාගෙන් ලැබුණු අරමුදලෙන් ත්‍රිකුණාමලය, මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කවල සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති 32 කට සහල් මෝල් හිමියන් නඟා සිටුවීමේ අරමුණින් වී මිලදී ගැනීමේ අත්තිකාරම් රු. 129,700,000 ක් ගෙවා තිබූ අතර එම මුදල් සහල් අලෙවියෙන් ලැබෙන ආදායමෙන් මාස 06 ක් ඇතුළත අයකර ගත යුතු විය. 2021 දෙසැම්බර් 15 දින නැගෙනහිර පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා විසින් ඇති කරගත් ගිවිසුමට අනුව අම්පාර දිස්ත්‍රික්කයේ මුදල් ආපසු ගෙවීම පැහැර හරින ලද සහල් නිෂ්පාදකයින් 10 දෙනෙකු සඳහා 2024 මාර්තු 07 දින ගෙවන ලද රු.16,000,000 ක මුදලක් ඇතුළුව රු.101,640,000 ක මුදලක් අයකර ගැනීමට කටයුතු නොකර 2025 අප්‍රේල් 30 වන විට මාස 10 සිට වසර 03 ක කාලයක් සිට හිඟ ශේෂයක් පැවතුණි.	ආහාර කොමසාරිස්ගෙන් උපදෙස් ඉල්ලා සිටියද ලැබී නොමැත. පොලිසියට සම්බන්ධ නොවන ගිවිසුම්ගත ගැටළුවක් බැවින් ණය අයකර ගැනීමේ ආඥා පනත හෝ පොදු දේපළ පනත යටතේ කටයුතු කරන ලෙස නිර්දේශ විය. නැගෙනහිර පළාත් නීති ඒකකය මඟින් විධිමත් ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලා ඇත.විධිමත් ඉල්ලීමක් නීතිපති දෙපාර්තමේන්තුවට යවා ඇත.	ගිවිසුම අනුව ලබාදුන් අත්තිකාරම් මුදල් නිසි පරිදි අයකර ගැනීමට හා හිඟව පවතින මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.12 ශීර්ෂය - 934 - පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
මඩකලපුව දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික කටයුතු වැඩි දියුණු කිරීම සඳහා 2011දී රු.19,628,116ක් වටිනා කොබෙල්කෝ කැණීම් යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණු නමුත් එය අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කර නොතිබූ අතර යන්ත්‍ර ක්‍රියාකරුවෙකු නොමැතිවීම හේතුවෙන් වසර 05 කට වඩා වැඩි කාලයක් මඩකලපුව නියෝජ්‍ය වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ ස්ථානයක මලකෑමට ලක්වෙමින් තබා තිබුණි.	දැනට අම්පාර දිස්ත්‍රික්කයේ වාරිමාර්ග යෝජනා ක්‍රම සඳහා කැණීම් යන්ත්‍රය භාවිතා කිරීමට පියවර ගෙන ඇත.	මිලදී ගන්නා යන්ත්‍ර සූත්‍ර ඌණ උපයෝජිත වීමට ඉඩ නොදී අඛණ්ඩව භාවිතා කිරීම සිදු කළ යුතුය.

1.5.13 ශීර්ෂය - 940 අධ්‍යාපන අමාත්‍යාංශය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අංක 05/2016 හා 2016 මාර්තු 09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (ii) හා (iii) වගන්තිවල පටහැනිව මඩකලපුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට ප්‍රවාහන සහ ඉන්ධන දීමනා ගෙවා තිබුණද, 2023 නොවැම්බර් 08 සිට 2024 නොවැම්බර් 28 දක්වා කාලය තුළ ඔහු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා ආවරණ රාජකාරිය ඉටු කිරීම වෙනුවෙන් රු. 3,084,881 ක්වූ අමතර ඉන්ධන වියදම් ප්‍රතිපූරණය කර තිබුණි.	නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක EP/01/C/VH/008 හා 2023.12.15 දිනැති ලිපිය අනුව වාහනය භාවිතා කර ඇත.	අදාල චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.
(ආ)	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන සේවක ණය ශේෂය රු.350,726,306 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සේවක ණය පාලන ගිණුමේ ශේෂය රු.353,529,293 ක් වූයෙන්, වසර 05කට වැඩි කාලයක සිට රු.2,802,987ක නොසැසඳුනු වෙනසක් එම ප්‍රකාශ 02 අතර පැවතුණි.	රු. 263,000 ක වෙනස - වැටුප් අඩු කිරීමක් බොල් ණයක් ලෙස ගැනීම නිසා 12,100 ඉවත් කිරීම සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව අනුමැතිය ඉල්ලා ඇත. 3,078,097 - සමන්තුරෙයි කලාප අධ්‍යාපන කාර්යාලයට අදාල ලේඛන නොමැති නිසා කපා හැරීමට අවසර ඉල්ලා ඇත. (2017 සිට)	වෙනසට හේතු පරීක්ෂා කර කඩිනමින් අයකිරීමට කටයුතු කළ යුතුය.

(ඇ)	2022 සිට 2024 දක්වා වූ කාල පරාසය තුළ නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පවත්වන ලද විවිධ විනය පරීක්ෂණ සහ ඒවායේ නීතිමය කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට ගෙවූ රු.681,250 ක් හා රු.1,402,375 ක් වූ දීමනාවල එකතුව ලෙස රු.2,083,625 ක් ගෙවා ඇතත්, එම විනය පරීක්ෂණ මේ දක්වා අවසන් කර නොතිබුණි.	නීතිමය කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත රු.681,250 ක් ගෙවා තිබුණි. අවසන් ක්‍රියාමාර්ග ගැනීමට විමර්ශන වාර්තා ප්‍රධාන ලේකම් වෙත යවා ඇත.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2019 අනුව විනය පරීක්ෂණ නිසි කාල සැලසුමකට අනුව අවසන් කළ යුතුය.

1.5.14 ශීර්ෂය - 950 - සෞඛ්‍ය අමාත්‍යාංශය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කල් ඉකුත් වීමට ආසන්න ඖෂධ වර්ග හඳුනාගෙන එම ඖෂධ අවශ්‍ය රෝහල් සඳහා කඩිනමින් බෙදා හැරීමට කටයුතු නොකිරීම මත මීරවෝඩයි ප්‍රාදේශීය රෝහලේ රු.2,613,772 ක් වටිනා ඖෂධ වර්ග 79 ක් කල් ඉකුත් වී තිබීම මත තහනම් කර තිබුණි.	මීරවෝඩයි ප්‍රාදේශීය රෝහලේ ඖෂධවේදියා සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් සිදු ඇත. මූලික විමර්ශන වාර්තාවේ සොයා ගැනීම් මත සම්පූර්ණ විමර්ශන ලියකියවිලි සමඟ කෙටුම්පත් චෝදනා පත්‍රයක් විනය ක්‍රියාමාර්ග සඳහා ත්‍රිකුණාමලය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට යොමු කර ඇත.	අදාල ඖෂධ කල් ඉකුත් වීමට පෙර නිසි ලෙස කළමනාකරණය කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියේ **(PHSSP)** බෙදාහැරීම් සම්බන්ධිත දර්ශක (**DLI-3)** හි අරමුණු වලට පටහැනිව**,** ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල 04 ක විවිධ කාර්යාල ගොඩනැගිලි 10 ක් ප්‍රතිසංස්කරණය කිරීම**,** කාර්යාල ගෘහ භාණ්ඩ සහ උපකරණ මිලදී ගැනීම සහ පරිපාලන කටයුතු සඳහා භාවිතා කරන නිල වාහන අලුත්වැඩියා කිරීම ආදිය සඳහා රු. 197,970,611 ක මුදලක් ගෙවා තිබුණි.	කොන්ත්‍රාත් වැඩ කටයුතු 12 ක් වෙනුවෙන් එකතුව රු.83,388,510 ක වැඩ සඳහා පිළිතුරු ලබාදී ඇත.	ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියේ අරමුණුවලට අනුව වැය කිරීම සිදු කළ යුතුය.

1.5.15 ශීර්ෂය - 961 - මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ත්‍රිකුණාමලය සහ කල්මුණේ ප්‍රාදේශීය මාර්ග සංවර්ධන කාර්යාල මගින් විවිධ ආයතන සඳහා මුදල් අයකර ගැනීමෙන් තොරව යන්ත්‍රෝපකරණ කුලියට දී තිබීම හේතුවෙන් රු.1,089,894 ක කුලී	රු.1,089,894 ක හිඟ කුලී ශේෂයෙන් රු.349,256 ක් අයකර ගෙන ඇත. ඉතිරි ශේෂය අයකර ගැනීමට නීති ඒකකය හරහා කටයුතු කර ඇත.	තවදුරටත් අයකර ගැනීමට ඇති හිඟ කුලී මුදල වූ රු.740,638 ක් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ

	මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය වන තෙක් අයකර ගෙන නොතිබුණි. හිඟ කුලී මුදල වසර 01 සිට 13 කාල පරාසයක පැවතුණි.		යුතුය.
(ආ)	මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල 04ක රු. 80,229,980ක් වටිනා මාර්ග වැඩ යන්ත්‍රෝපකරණ වර්ග 22ක් වසර 15කට වඩා වැඩි කලක් ඵලදායි කටයුතු වලට භාවිතා කිරීමට පියවර ගෙන නොතිබුණි.	අළුත්වැඩියා කළ නොහැකි යන්ත්‍රෝපකරණ මෙම වසරේදී වෙන්දේසි කිරීමට නිර්දේශ කර ඇත.	මිලදී ගන්නා යන්ත්‍ර සූත්‍ර ඌණ උපයෝජිතවීමට ඉඩනොදී අඛණ්ඩව භාවිතා කිරීම සිදු කළ යුතුය.

1.5.16 නිවාස අධිකාරිය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
අධිකාරිය සකසා ගෙන තිබෙන කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිසි අනුමැතියක් ලබා නොගෙන වසර 10 ක කාලයක සිට ස්ථිර/අනියම්/කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 26 දෙනෙකු පත් කර තිබුණු අතර සහ සමාලෝචිත වර්ෂය තුළ ඔවුනට එකතුව රු.11,280,000 ක් වැටුප් ගෙවා තිබුණි.	සේවක සංඛ්‍යාව අනුමත කර ගැනීම සඳහා සේවක සංඛ්‍යා සමාලෝචන කොමිසම සමඟ සාකච්ඡා කර ඇත.	අදාල පත්වීම් නිසි අනුමැතිය ලබා ගැනීමෙන් පසු සිදු කළ යුතුය.